# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# පුරප්පාඩු

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් 2026.03.27 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## නිවාස භාරකරු හා අරක්කැමි III ශ්‍රේණිය තනතුර (පුරප්පාඩු 01)

**සුදුසුකම් :**

1. අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ගණිතයද සම්මාන සාමාර්ථ (C) දෙකක් (02) ක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් (06) සමත් වී තිබීම සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 2 හෝ 3 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක්, ඉහත කාර්යයට අදාළ තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලැබිය යුතුය

**හෝ**

2. අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී ගණිතයද සම්මාන සාමාර්ථ (C) දෙකක් (02) ක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් (06) සමත් වී තිබීම සහ කාර්මික කුසලතා සහිත අදාළ ක්ෂේත්‍රයක වසරක (01) සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** : U-PL 2(III) රු. 44,575 - 16 X 490 - 52,415 p.m (මාසික)

(මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.)

**සැලකිය යුතුයි**

i. පූර්ණකාලීනව රැඳී සිටිය යුතුය.

ii. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

iii. රාජකාරි සඳහා සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතුය.

iv. විශිෂ්ඨ හා සදාචාරසම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

ඉහත තනතුර සඳහා බඳවාගැනීම සිදු කරනු ලබන්නේ අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07 පරිශ්‍රයේ පිහිටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයට බව සලකන්න.

**අයදුම්පත් ක්‍රියාපටිපාටිය**

i. ලිපිද්‍රව්‍ය හා විභාග කටයුතු වෙනුවෙන් ආපසු නොගෙවන පදනම මත රු.500/- ක ගාස්තුවක් අයකරනු ලැබේ. එම මුදල ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 0002323287 දරණ ගිණුමට බැර කර, එහි රිසිට්පත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

ii. අයදුම්පත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වන www.ugc.ac.lk වෙතින් බාගත කරගත යුතු අතර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත **"නියෝජ්‍ය ලේකම්/ පිරිස්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07"** යන ලිපිනයට 2026.03.27 දින ප.ව. 4.00ට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු වේ.

iii. අදාළ සහතිකවල පිටපත් සහතික කර, අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

iv. ඉහත වෙබ් අඩවියෙන් බාගත කරන ලද ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් පමණක් සලකා බලනු ලබන අතර, අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් නොකිරීම හා අදාළ සහතිකවල පිටපත් අමුණා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

v. කිසියම් හේතුවක් මත යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප වුවහොත් එම අයදුම්පත නැවත සලකා බලනු නොලැබේ.

vi. රාජ්‍ය සේවයේ හෝ සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධාන මගින් එවිය යුතුය.

vii. ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන් වූ අවසානාත්මක තීරණයන් ගැනීම පිළිබඳ අයිතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු වේ.

**ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,**
**අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.**
**2026.03.11 වන දින**